# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## මාධ්‍ය නිවේදනය

සියළුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

**<u>ශ්‍රී ලාංකේය කතානාද සිනමාවේ හා ජාතික චිත්‍රපට සංස්ථාවේ සංවත්සර සැමරුම - 2026</u>**

1947 වර්ෂයෙන් ඇරඹී වසර 79ක් සපුරන සිනමාව සංස්කෘතියක් ලෙස සලකා එහි රසඥතාවය හා අධ්‍යාපනික වටිනාකම සමාජගත කිරීමේ වැඩසටහන්, සිනමා ක්ෂේත්‍රයේ නියුතු වූවන් දිරි ගැන්වීමේ හා අගැයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ජාතික වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව වෙත පැවරී ඇත. සිනමා ක්ෂේත්‍රය කර්මාන්තයක් යන පුළුල් අර්ථයෙන් සලකා ඊට උරදී සිටින කුඩා, මධ්‍යම සහ මහා පරිමාණ වෘත්තිය ක්ෂේත්‍රයන් ආරක්ෂා වන අයුරින් අණපනත් හා රෙගුලාසි පැනවීම, ප්‍රදර්ශන ක්‍රියාවලිය පාලනය හා සිනමාශාලා ප්‍රමිති පාලනය ආදී විවිධ අංශයන් ඔස්සේ සමස්ථ ප්‍රේක්ෂක සමූහය වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ක්‍රියා කරනු ලැබේ.

තවද, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව පිහිටුවා මේ වන විට වසර 54ක් ගත වී ඇති අතර මේ වන විට ලෝක සිනමාව අංකිත (ඩිජිටල්) තාක්ෂණයට පරිවර්තනය වී ඇත. ඒ අනුව, එළැඹෙන ඉදිරිකාල වකවානුවේ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව වෙත පැවරෙන වගකීම් වඩාත් අභියෝගාත්මකය.

ඉහතින් සංක්ෂිප්තව සඳහන් කල දශක අටකට ආසන්න දීර්ඝ සිනමා චාරිකාවේ තවත් එක් සැමරුම් උත්සව අවස්ථාවක් වෙත අපි එළඹ සිටිමු.

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනවි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ හා සිනමා කලාකරුවන්ගේ සහභාගීත්වයෙන් ප්‍රධාන සංවත්සර උත්සවය 2026 ජනවාරි 21 වන දින ප.ව.3.00 සිට** ජාතික චිත්‍රපට සංස්ථා තරංගනී සිනමා ශාලාවේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. **(මෙම උත්සවය ආරාධිතයින් සඳහා පමණි.)**

තවද, මෙම සංවත්සර සැමරුමට අදාළ ව වැඩසටහන් මාලාව පහත පරිදි සිදු කිරීමට ද නියමිතය.

- **2026 ජනවාරි 22 දින සිට 25 දක්වා** නොමිලයේ පැවැත්වෙන **සංවත්සර චිත්‍රපට දැක්ම (ජාතික චිත්‍රපට සංස්ථා තරංගනි සිනමාශාලාව)**
- **2026 ජනවාරි 23 වන දින පෙ.ව. 09.30 සිට ප.ව.1.30 දක්වා** පැවැත්වෙන **චිත්‍රපට අළෙවිකරණය පිළිබඳ විද්වත් ප්‍රවීණත්ව වැඩමුළුව (Masterclass) -** සම්පත් දායකත්වය : **Professor Finola Kerrigan - Marketing Professor at the University of Birmingham's Birmingham Business School – United Kingdom (ජෝ අබේවික්‍රම කේන්ද්‍රය - ජාතික චිත්‍රපට සංස්ථාව -** ***ආරාධිතයින් සඳහා පමණයි.)***
- **2026 ජනවාරි 31 වන සෙනසුරාදා දින පෙ.ව.09.30 - ප.ව.03.00 දක්වා සිනමා ශිල්පීන් වෙනුවෙන් නොමිලයේ පැවැත්වෙන වෛද්‍ය සායනය** (ජාතික චිත්‍රපට සංස්ථා පරිශ්‍රය)

2026 ජනවාරි 21 වන දින පැවැත්වෙන සංවත්සර සැමරුම් උත්සවයේදී **ජාතික චිත්‍රපට සංස්ථා සිනමා ඩිප්ලෝමාලාභී අනුර දහනායක මහතාගේ "සිනමා නදියේ උඩුගං බලා" ග්‍රන්ථය ජනගත කිරීම හා "චිත්‍රපට" සඟරාවේ** නවතම කලාපය එළි දැක්වීමට ද නියමිතය.

ඉහත සංවත්සර උත්සවය සහ වැඩසටහන් මාලාව ආවරණය සඳහා ඔබ මාධ්‍ය ආයතනයේ ගෞරවනීය සහභාගීත්වය අපේක්ෂා කරන අතර, 2026 ජනවාරි 22 දින සිට 25 දක්වා ජාතික චිත්‍රපට සංස්ථා තරංගනි සිනමාශාලාවේදී නොමිලේ පැවැත්වෙන සංවත්සර චිත්‍රපට දැක්ම හා ජනවාරි 23 දින පැවැත්වෙන වැඩමුළුව සඳහා අවශ්‍ය මාධ්‍ය ප්‍රචාරණය වෙනුවෙන් ඔබ ආයතනයේ උපරිම දායකත්වය ලබා දෙන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමු.

***විමසීම් - අළෙවි, නිෂ්පාදන හා පර්යේෂණ අංශය (011-2590761)***

**සුදත් මහදිවුල්වැව**
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

2026 ජනවාරි 14 දින.

**අංක : 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07**
**☎ 011 2584623 🖷 011 2585526 ✉ filmcorp@sltnet.lk**